# 1977 න් පසු ශ්‍රී ලංකාවේ ඉරණම හා
# රට එම උගුලෙන් ගලවා ගැනීමට ඔබ අප සතු වගකීම

- නූගත්, පහත් චරිතලක්ෂණ ඇති මැරවරයන්, හොරුන් වංචා කාරයින් ජනතා නියෝජිතයන් ලෙස පාර්ලිමේන්තුවට යැවීමට හැකිවනසේ රටේ දේශපාලන ක්‍රමය ඔවුන් වෙනස් කරගත්හ. ඒ හරහා රටේ දේශපාලන අස්ථාවරත්වයක් ඇති කිරීමේ හා ජනතාවට රටේ දේශපාලනය එපා කරවීම ඔවුන්ගේ අරමුණ විය.
- දේශපාලනයට සමගාමීව යන පාතාල ලෝකය යයි කියාගන්නා මිනීමරු කල්ලි පෝෂණය කරමින් විරුද්ධ මතධාරී කණ්ඩායම්  මර්ධනය කිරීමට හා තම මැතිවරණ ක්‍රියාවලියට සහය ලබාගැනීමට ඔවුන්ව භාවිත කලහ.
- දේශීය ව්‍යාපාරිකයන් හා ගොවීන්ව අසරණ කරමින් ඔවුන්ගේ නිෂ්පාදන වල තත්වය පහත හෙලමින් රටට නොගැලපෙන එහෙත් ඔවුනට හිතවත් එක්තරා සමාජ පන්තියක් පමණක් ශක්තිමත් කල හැකි විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දුන්හ.
- ඒ හරහා ඔවුනට හිතවත් බහුජාතික සමාගම් වලට රට තුල රිසි සේ කටයුතු කරන්නට ඉඩ ලබා දුන් අතර ඒ හරහා බටහිර රටවල් වලට හා යම් යම් සංවිධාන වලට ව්‍යාපාරික අරමුණු වලට වඩා වෙනත් අරමුණු ඉටු කරගැනීමේ අවසරය ලබා දුන්හ.
- රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට තිබූ කර්මාන්තයන් බොහොමයක් බහුජාතික සමාගම් වලට ඔවුන් විකුණා දැමූහ. ඉතිරි ඒවාද දුර්වල කරමින් විකුණීමට පිඹුරුපත් සැකසූහ.
- එම සමාගම් වලින් ලැබුනු පිදේනි වලින් තම පවුල්වල හා තමන්ට අයත් සමාගම්වල ආර්ථිකය ශක්තිමත් කරගත්හ
- කොටි සංවිධානය නමින් වූ දේශද්‍රෝහී සංවිධානය පොෂණය කරමින් තම දේශපාලන අරමුණු උදෙසා ඔවුන්ව ප්‍රයෝජනයට ගැනීම.
  - තම වැඩපිළිවෙලට බාධාවක් වන නායකයින් හා වෙනත් පුද්ගලයින් ඝාතනය කරමින් තම හිතවතුන්ට බලය ලබාගැනීමට ඉඩකඩ සැකසීම,
  - මානව හිමිකම්, ණය හා ආධාර වල මුවාවෙන් බටහිර ක්‍රිස්තියානි අධිරාජ්‍යයේ ජාත්‍යන්තර නියෝජිතයින් හට රිසි සේ රටට එමට මාර්ගය සැකසීම )
  - රටේ ආර්ථිකය දුර්වල කරමින් බටහිර ක්‍රිස්තියානි අධිරාජ්‍යයේ රටවල් වලින් ණය ගැත්තෙකු බවට පත්කරලීම.
  - සිංහල ජාතිය හා බෞද්ධයන් පිළිබඳව තිබෙන යහපත් ප්‍රතිරූපය බිඳදැමීම.
- අද ශ්‍රීලාංකික තරුණ පරපුර අති භයානක ඉරණමකට මුහුන දෙමින් සිටියි. පෙර සඳහන් කරන ලද බටහිර ක්‍රිස්තියානි අධිරාජ්‍යවාදීන්ට අයත් බහුජාතික සමාගම්වල දේශීය වෙස්මුහුණු දමාගත් නියෝජිත ආයතන බිහිවී ඇත. ප්‍රධාන වශයෙන් ජනමාධ්‍ය, මත්පැන් නිෂ්පාදනය හා අලෙවිය, දුම්වැටි නිෂ්පාදනය හා අලෙවිය, කිරිපිටි තිරිඟුපිටි හා වෙනත් ආහාර ආනයනය, සුදු හා ඔට්ටු ඇල්ලීමේ මධ්‍යස්ථාන (රේස් බුකි) යන ක්ෂේත්‍ර වලට අයත්ව ඔවුන්ගේ ක්‍රියාකාරකම් ව්‍යාප්තව පවතී. දේශීය මුහුණුවරකින් පෙනී සිටින සමාගම් මෙන්ම විජාතිකයින්ට අයත් සමාගම්ද මේ ගනයට අයත්වෙයි. පසුගිය අවුරුදු කිහිපය තුලදී ජන ජීවිතයේ බොහොමයක් අංග එම සමාගම් වල පාලනයට නතුව ඇති බව හොඳින් කල්පනා කලහොත් ඔබට වටහාගැනීමට හැකි වනු ඇත.
- 1948 දී අර්ධ වශයෙන්ද 1972 දී සම්පූර්ණයෙන්මද බටහිර ජාතීන්ට අහිමිවූ "ශ්‍රී ලංකා යටත් විජිතය " නැවත ලබාගැනීමේ කුමන්ත්‍රණය එසේ ආරම්භ වී ඇත. දූපත් මානසිකත්වයකින් මිදීම හා ජාත්‍යන්තර ප්‍රජාවගේ ( බටහිර ක්‍රිස්තියානි අධිරාජ්‍යයේ) සහයෝගශීත්වය. ගැන සඳහන් කරමින් රටේ ජනතාව දූප්පත් මානසිකත්වයකට ඇද දමා කරන  ද්‍රෝහී ක්‍රියාව වහාම නැවැත්විය යුතු කාලය එළඹ ඇත. (ලෝකයේ සියළු රටවල් බටහිර ක්‍රිස්තියානි අධිරාජ්‍යයේ සාමාජිකයෝ නොවෙති, බොහෝ රටවල් අප මෙන්ම එයිනි ගැලවීමට මාර්ග සොයමින් සිටිති.)
- ඉහත කරුණට අදාල උදාහරණ කිහිපයක් මෙසේ කෙටියෙන් ඉදිරිපත් කල හැක
  1- වර්තමාන එක්සත් ජාතික පක්ෂයේ ප්‍රමුඛව කටයුතු කරන රනිල් වික්‍රමසිංහ ඇතුළු ද්‍රෝහී කණ්ඩායම.
  2- මහාරාජා සමූහ ව්‍යාපාරය හා ඔවුන්ට අයත් දේශද්‍රෝහී මාධ්‍ය ජාලය.
  3- අරක්කු, බියර් හා වෙනත් මත්ද්‍රව්‍ය අලෙවි කරන සමාගම්.
  4- සිගරට් හා අනෙකුත් දුම් වැටි වර්ග අලෙවි කරන සමාගම්.
  5- තිරිඟු පිටි ඒකාධිකාරය පවත්වාගෙන යන ප්‍රීමා සමාගම
  6- රටේ දුප්පත් ජනතාව සූරා කන නෙස්ලේ ඇතුළු බහුජාතික කිරිපිටි සමාගම් හා ඖෂධ සමාගම්
  7- ලලිත් කොතලාවල ප්‍රමුඛ සෙලින්කෝ සමූහ ව්‍යාපාරය.
- මතක තබාගන්න ඔවුන් මේ පවා දෙනු ලබන්නේ ඔබගේ මුතුන් මිත්තන් විසින් අවුරුදු දහස් ගනනක් තිස්සේ ලේ කඳුලු දහඩිය හෙලා රැකගත් මතු පරපුර වෙනුවෙන් ඔබ විසින් රැක ගතයුතු ශ්‍රී ලාංකීය අනන්‍යතාවයයි. අතීත ලේ කඳුලු දහඩිය හෙලූ එම භූමියෙන් කොටසක් ද්‍රවිඩ කොටි ත්‍රස්තවාදීන්ටද තවත් කොටසක් බටහිර ක්‍රිස්තියානි අධිරාජ්‍යවාදීන්ටද පවරා දී ඉතිරි කොටසේ තම හිතවතුන් සමග රජ සැප විඳින්නට බලාපොරොත්තුවෙන් සිටින මෙම ද්‍රෝහීන්ගේ අරමුණ ඔබට නොවැටහෙන්නේ මන්ද?
- සමහර විට ඔබද එම ද්‍රෝහීන් සමග සිටිනෙකු විය හැක. එසේත් නැත්නම් ඉතාම සංවිධානාත්මකව හා සූක්ෂම ලෙස ක්‍රියාත්මක වන මෙම කුමන්ත්‍රණයේ සාමාජිකයින් විසින් ඔබගේ දැකීමේ, ඇසීමේ හා සිතීමේ මාර්ග අහුරා දමා ඇතිවා විය හැක. නැතිනම් ඔබ ඔවුන් විසින් ලබා දෙන විවිධ තාවකාලික ලාබ ප්‍රයෝජන ගැන සිතමින් ඇස් කන් පියාගෙන කට වසාගෙන ඔවුනට යටත්ව සිටිනවා විය හැක.
- මෙය නැවැත්වීමට ඔබට හැකි පමණින් සහාය වන්න. ද්‍රෝහී දේශපාළුවන්ගේ රැවටිලි බස් වලට හසුනොවී බුද්ධිමත්ව කටයුතු කරන්න. එකී දේශපාළුවන්ගේ පසුබිම හා අතීත ක්‍රියාකාරකම් මොනවා දැයි සොයා බලන්න. පසත්‍යය කුමක්දැයි වටහාගැනීමට ඔබට අපහසු නොවනු ඇත. කල යුත්තේ රටට ජාතියට ආගමට ආදරය කරන නියම ශ්‍රීලාංකිකයකු ලෙස කටයුතු කිරීමයි.
- අද ඔබ එසේ කටයුතු නොකලහොත් එහි අයහපත් ප්‍රතිඵලය ඔබගේ දරු දැරියන් හට විඳීමට සිදුවනු ඇත. එවිට ඔවුන්ගේද වසර දහස් ගනනක් තිස්සේ අපගේ වටිනා උරුමට දිවිපරදුවට තබා රැකගත් අතීත මුතුන මිත්තන්ගේත් ශාපයෙන් ඔබට කිසිදා ගැලවීමට නොහැකි වනු ඇත.

ද්‍රෝහීන්ට ඔවුන්ගේ අරමුණු ඉටුකරගැනීමට ඉඩ නොදෙන්න.

ශ්‍රීලාංකිකයිනි පටු බේද නොතකා රට ජාතිය ආගම සුරැකීමට නොබියව පෙරට එන්න.

http://www.geocities.com/lakdaruwo